**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**HISTORY**

**ඉතිහාසය**

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ඉතිහාසය - I

## අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 1 යි**

සැලකිය යුතුයි.

- 1 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වරණ අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න. සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වනු ඇත.

1) 'ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත් පැරණිතම කෘතිය දීපවංශයයි.' දීපවංශය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. මෙම කෘතිය තුළ පුනරුක්ති දෝෂ දක්නට ලැබීම.
2. මහසෙන් රාජ්‍ය සමය අවසානය තෙක් තොරතුරු අන්තර්ගත වීම.
3. ක්‍රි.ව. 7 වන සියවසේ දී රචනා වී ඇත.
4. ශාසන ඉතිහාසය සම්බන්ධ පුවත් දීපවංශයට ඇතුළත් ය.

2) කෝට්ටේ රාජ්‍ය කාලයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ඉතිහාසය හැදෑරීමේ දී අදාළ සාහිත්‍ය මූලාශ්‍රයක් නොවන්නේ,

1. සංදේශ කාව්‍ය 2. ප්‍රශස්ති කාව්‍ය 3. හටන් කාව්‍ය 4. ධාතු වංශය

3) ශ්‍රී ලංකාවේ ශාසන ඉතිහාසය පිළිබඳව හැදෑරීමට සුදුසු ග්‍රන්ථයක් වන්නේ,

1. නිකාය සංග්‍රහය 2. බෝධි වංශය 3. පූජාවලිය 4. සද්ධර්මාලංකාරය

4) පහත සඳහන් 'අ' තීරුවේ දැක්වෙන මූලාශ්‍රයන්ට අදාළ තොරතුර 'ආ' තීරුවෙන් ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. පාහියන් හිමිගේ වාර්තා | A. ආර්ථිකය හා තාක්ෂණය පිළිබඳව |
| 2. පනාකඩුව තඹ සන්නස | B. සිත්නාරුබිම් බුදල්නාට කළගුණ සැලකීම පිළිබඳව |
| 3. මධ්‍යකාලීන රන් කහවනුව | C. බෞද්ධ රාජධානි පිළිබඳව |

1. BCA 2. CBA 3. BAC 4. ACB

5) පහත සඳහන් 'අ' සහ 'ආ' තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. කුරුණෑගල යුගය | A. සිංහල බෝධි වංශය |
| 2. දඹදෙණි යුගය | B. මයුර සංදේශය |
| 3. ගම්පොළ යුගය | C. පූජාවලිය |
| 4. කෝට්ටේ යුගය | D. ගුත්තිල කාව්‍යය |

1. BCDA 2. BCAD 3. ACBD 4. CABD

6) ඓතිහාසික යුගයන්ට අයත් වන නටඹුන්වලට නිදසුන් පහත දක්වා ඇත. එහි සාවද්‍ය වරණය තෝරන්න.

1. අනුරාධපුර යුගය- අශ්ව හිස සහ මිනිසා, සීගිරිය, ලෝවාමහාපාය
2. පොළොන්නරු යුගය - ගල්පොත ලිපිය, ශිව දේවාලය සහ සත්මහල් ප්‍රාසාදය
3. ගම්පොළ යුගය- ඇම්බැක්කේ, ලංකාතිලක විහාරය සහ ගඩලාදෙණිය
4. දඹදෙණි යුගය- බෙලිගල දළදා මාළිගාව, විජය සුන්දරාරාමය, කළුදිය පොකුණ

7) ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් ඉරණමඩු සැකැස්මට අයත් සාක්ෂි හමුවන ප්‍රදේශ වන්නේ,

1. කඳුකර වියළි කලාපීය බොරළු මිශ්‍ර පස් තට්ටුවයි.
2. අර්ධ ශුෂ්ක කලාපයේ මැටි හා බොරළු තට්ටුවයි.
3. තෙත් කලාපීය වෙරළබඩ ප්‍රදේශයයි.
4. ශුෂ්ක කලාපීය පස් මිශ්‍ර තට්ටුවයි.

8) ප්‍රාග් ඓතිහාසික ජනාවාස ප්‍රදේශයන්ට අයත්වන 'පහතරට තෙත් කලාපීය එළිමහන් කඳවුරු' වලට නිදසුනක් වන්නේ,

1. බෙල්ලන්බැඳි පැලැස්ස 2. සීගිරි පොතාන 3. පතිරාජවෙල 4. අලිගල

9) විජය ඇතුළු පිරිස මෙරටට පැමිණෙන සමයේ මෙරට සිටි කුවේණිය ඇතුළු ස්වදේශිකයන් අයත් වන්නේ,

1. පූර්ව ඓතිහාසික යුගයට ය. 2. ප්‍රාග් ඓතිහාසික යුගයට ය.
3. මුල් ඓතිහාසික යුගයට ය. 4. මුල් ප්‍රාග් ඓතිහාසික යුගයට ය.

10) පහත සඳහන් 'අ' සහ 'ආ' තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. නියම් ගම් | A. වඩුවන් විසූ ගම් |
| 2. පරික්ඛිත්ත ගම් | B. වෙළඳ ගම් |
| 3. වඩ්ඪකීගාම | C. ධීවරයින් ජීවත් වූ ගම් |
| 4. සුමනවාපිගාම | D. වැටකින් ආරක්ෂා වූ ගම් |
| | E. වැව්ගම් |

1. DBEC 2. BDAE 3. CBAE 4. EDBA

11) ගමික සතු කාර්යයන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ගම් අතර විවිධ සම්බන්ධතා පවත්වාගෙන යාම.
2. ගම වෙනුවෙන් තීරණ ගැනීම.
3. පොදු වැඩවලට නායකත්වය දීම.
4. ඉහත සඳහන් සියල්ලම ය.

12) පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. වියළි කලාපයේ වසර පුරාම ජලය සපයාගත නොහැකි වුවද පසේ සාරවත් බව නිසා මූලික ජනාවාස එම ප්‍රදේශවල ව්‍යාප්ත විය.
2. ගමිකයන් ගෘහපතීන් අතරින්ම පත් වූ කෙනෙකු බව බුද්ධඝෝෂ හිමි සමන්ත පාසාදිකාවේ සඳහන් කර ඇත.
3. දේවානම්පියතිස්ස රජු ලංකාවේ ප්‍රථම බෞද්ධ රජු මෙන්ම දෙවතාවක් අභිෂේක කළ එකම රජු වේ.
4. ලංකාව ප්‍රථම වරට එක්සේසත් කළේ දුටුගැමුණු රජු ය. රජුට සහය දුන් සෙන්පතිවරු ඊට පෙර පරුමකවරු ලෙස කටයුතු කර නැත.

13) ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය සහෝදරයාගෙන් සහෝදරයාට හිමි වූ අවස්ථාවකට උචිත නිදසුන වන්නේ,

1. මුටසීව රජුගෙන් පසු දේවානම්පියතිස්ස රජුට රාජ්‍යත්වය හිමි වීම.
2. කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු රජුට රාජ්‍යත්වය හිමි වීම.
3. දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස රජුට රාජ්‍යත්වය හිමි වීම.
4. පණ්ඩුකාභය රජුගෙන් පසු මුටසීව රජුට රාජ්‍යත්වය හිමි වීම.

14) පහත සඳහන් 'අ' සහ 'ආ' තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. බුද්ධදාස රජු | A. රෝහල්වල පහසුකම් ඇති කිරීම. |
| 2. V වන මිහිඳු රජු | B. මාතෘ නිවාස ඇති කිරීම - පසවන්නිනාම සාලා |
| 3. IV වන කාශ්‍යප රජු | C. උණ රෝගීන්ට රෝහල් ඉදිකිරීම - උපසග්ග රෝග නාසා |
| 4. I වන උපතිස්ස රජු | D. සොත්ථි ශාලා - මාතෘ නිවාස |
| | E. රෝහල් ඉදිකිරීම. |

1. ECAB 2. EACB 3. BECD 4. ADBE

15) 'අ' තීරයේ දැක්වෙන කරුණු හා සම්බන්ධ වරායන් 'ආ' තීරයේ දැක්වේ. 'අ' තීරයට අනුව 'ආ' තීරය ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. අනුරාධපුර යුගයේ අන්තර්ජාතික වෙළඳ වරාය | A. ලංකා පටුන |
| 2. පොළොන්නරු යුගයේ වැදගත් වූ වෙළඳ වරාය | B. දඹකොළ පටුන |
| 3. හේමමාලා හා දන්ත කුමරු | C. ගෝකණ්ණ වරාය |
| 4. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීම. | D. මහා තිත්ථ වරාය |

1. ABDC 2. ADCB 3. DCAB 4. CDAB

16) කිසිදු සතෙකු නොමැරිය යුතුය යන 'මාඝාත නීතිය' හඳුන්වා දුන් රජතුමා වන්නේ,

1. ආමණ්ඩ ගාමිණී අභය රජු 2. නිශ්ශංකමල්ල රජු
3. IV වන මිහිඳු රජු 4. V වන කාශ්‍යප රජු

17) III වන උදය රජු ස්ථාපිත කළ බුද්ධන්නේහෙළ සෙල්ලිපියේ සඳහන් වන්නේ,

1. කැළෑවේ ගස් කොළන් නොකැපිය යුතු ය.
2. වනාන්තර කළමනාකරණය කළ යුතු ය.
3. ඇළ මාර්ගවල කුඩා මසුන් නොමැරිය යුතු ය.
4. වගුරුබිම් ආශ්‍රිත පක්ෂීන් නොමැරීම කළ යුතු ය.

18) සිය පාලන මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය තෝරාගෙන අනුරාධපුර රාජධානිය ගොඩනැගීම සිදුකළ රජතුමා වන්නේ,

1. දේවානම්පියතිස්ස රජු
2. පණ්ඩුකාභය රජු
3. දුටුගැමුණු රජු
4. සීගිරි කාශ්‍යප රජු

19) පහත සඳහන් 'අ' සහ 'ආ' තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. යාපන රාජ්‍යයේ ආරම්භක පාලකයා | A. දෙවන සංකිලි |
| 2. යාපන රාජ්‍යයේ අවසාන පාලකයා | B. පරරාජසේකරම් |
| 3. පෘතුගීසීන් එන විට යාපනයේ පාලකයා | C. පළමු සංකිලි |
| 4. වීදිය බණ්ඩාරට රැකවරණය සැලසූ යාපන පාලකයා | D. විජය කුලංකෙ |

1. DABC
2. CADB
3. BCDA
4. ACDB

20) පහත සඳහන් සේවාවන් ඉටුකළ රජතුමා වන්නේ,

- රටේ අධ්‍යාපනික හා සාහිත්‍ය කටයුතුවලට කළ සේවය නිසා සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ඇතිවීම.
- සපුමල් කුමාරයා යටතේ හමුදාව යවා යාපනය ජය ගැනීම.
- උඩරට සාමන්ත පාලකයා වූ ජෝතිය සිටුවරයා ඇති කළ කැරැල්ල මැඩ පැවැත්වීම.
- අවසන් වරට ලංකාව එක්සේසත් කර ආර්ථික වශයෙන් රට සමෘද්ධිමත් කිරීම.

1. IV පරාක්‍රමබාහු රජු
2. VI පරාක්‍රමබාහු රජු
3. II පරාක්‍රමබාහු රජු
4. I පරාක්‍රමබාහු රජු

21) මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. මහනුවර පරිපාලන සංවිධානයේ ඉහළම පුද්ගලයා වූයේ රජු ය.
2. මහනුවර ප්‍රාදේශීය පාලන සංවිධානය රට හා දිශාව ලෙස කොටස් 2කින් සමන්විත විය.
3. මහනුවර යුගයේ සමාජ සම්බන්ධතා කුල ක්‍රමය අනුව සිදුවිය.
4. දිසාව තුළ සිටි ශිල්පීන් හෝ කුල, බද්දේ සංවිධානය ලෙස හැඳින්විණි.

22) පෘතුගීසීන් වෙත පලාගොස් දොන් පිලිප් නමින් බෞතීස්ම කරනු ලැබූ උඩරට ප්‍රභූවරයා,

1. කරලියද්දේ බණ්ඩාර
2. වීරසුන්දර බණ්ඩාර
3. යමසිංහ බණ්ඩාර
4. ජයවීර බණ්ඩාර

- A සිට J දක්වා තොරතුරු ඇසුරින් 23, 24 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| වර්ෂය | යුරෝපීය දූතයා | හමු වූ පාලකයා |
|---|---|---|
| A - 1505 | D - ජොරිස් වැන් ස්පිල්බර්ජන් | G - අටවන වීර පරාක්‍රමබාහු රජු |
| B - 1602 | E - ලොරෙන්සෝ ද අල්මේදා | H - කීර්ති ශ්‍රී රාජසිංහ රජු |
| C - 1762 | F - ජෝන් ෆයිබස් | J - පළමුවන විමලධර්මසූරිය රජු |

23) පෘතුගීසීන්ගේ ප්‍රථම දූත ගමන හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

1. BDG 2. AFH 3. CEJ 4. AEG

24) උඩරට රාජධානිය සමග පැවැත්වූ ලන්දේසි දූත සබඳතාව පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

1. BDH 2. BDJ 3. CFH 4. AEG

25) බුදු දහම වැළඳ, වැලිවිට ශ්‍රී සරණංකර හිමිගේ උපදෙස් පරිදි බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම සඳහා උත්සාහ ගත් නායක්කාර් වංශික රජු වන්නේ,

1. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
2. පළමු විමලධර්මසූරිය රජු
3. ශ්‍රී විජය රාජසිංහ රජු
4. රාජාධි රාජසිංහ රජු

26) ක්‍රි.ව. 1548 දී සීතාවක මායාදුන්නේ රජු සමග සන්ධානයකට පැමිණි යාපන පාලකයා වන්නේ,

1. පරරාජසේකරම්
2. කුලශේකරම්
3. එදිරිමානසිංහම්
4. පළමු සංකිලි

- පහත දක්වා ඇති තොරතුරු ඇසුරින් 27, 28 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A - කාරක සභා සභාපති

B - අමද්‍යප උද්ඝෝෂණ ව්‍යාපාර

C - මුදල් ලේකම්

D - ලංකා ජාතික සංගමය

E - ලංකා ස්වාධීනතා පනත

27) ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලට පමණක් අදාළ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

1. A හා C 2. C හා E 3. A හා D 4. C හා B

28) මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සමයේ සිදු වූ විශේෂ සිදුවීම් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. C හා D 2. B හා D 3. E හා B 4. D හා A

29) මදුරාසි පාලනය යටතේ පත්කළ අවුම්ල්දාර්වරුන්ට පැවරුණු කාර්යය වන්නේ,

1. අධිකරණ කටයුතු සිදු කිරීම.
2. මුහුදුබඩ ප්‍රදේශ පාලනය
3. බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසියෙන් මිළ දී ගැනීම.
4. මුහුදුබඩ ප්‍රදේශවල බදු ආදායම් එකතු කිරීම.

30) A - සභ, වෙද, ගුරු, ගොවි, කම්කරු බලවේග ඒකරාශී වීම.

B - සහල් මිළ සහළ යාම නිසා වාමාංශික පක්ෂ මෙහෙයවූ හර්තාල් ව්‍යාපාරය නිසා 1953 දී අගමැති තනතුරින් ඉල්ලා අස්වීම.

C - ලොව ප්‍රථම අගමැතිනිය ලෙස පත්වීම.

ඉහත සිදුවීම් හා සම්බන්ධ අගමැතිවරුන් පිළිවෙළින් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1. ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක
2. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක, සිරිමාවෝ බණ්ඩාරනායක
3. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක, ජෝන් කොතලාවල, සිරිමාවෝ බණ්ඩාරනායක
4. ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, සිරිමාවෝ බණ්ඩාරනායක

31) කඩිනම් මහවැලිය යටතේ ඉදිකළ ජලාශ (අ) තීරුවේ ද, ඒ සඳහා ආධාර ලබාදුන් රටවල් (ආ) තීරුවේ ද දැක්වේ. (අ) තීරුවට අනුව (ආ) තීරුව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| <u>අ</u> | <u>ආ</u> |
|---|---|
| 1. කොත්මලේ ජලාශය | A. බටහිර ජර්මනිය |
| 2. වික්ටෝරියා ජලාශය | B. ස්වීඩන් |
| 3. රන්දෙණිගල ජලාශය | C. බ්‍රිතාන්‍යය |
| | D. චීනය |

1. DBC  2. CBA  3. BCA  4. ACB

32) බ්‍රිතාන්‍යයන් විසින් ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීමේ ප්‍රබල ව්‍යාපාරය වූයේ මිෂනාරි ව්‍යාපාරය යි. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල මිෂනාරි කටයුතු සිදුකල මිෂනාරි සමාගම වන්නේ,

1. වෙස්ලියන් මිෂනාරි සමාගම
2. ඇමෙරිකානු මිෂනාරි සමාගම
3. චර්ච් මිෂනාරි සමාගම
4. ලන්ඩන් මිෂනාරි සමාගම

33) පුනරුදය ඇති වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,

1. විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව
2. වෙළෙඳාම දියුණු වීම හා නව ධනවතුන් බිහි වීම.
3. කොන්ස්තන්තිනෝපලය තුර්කි මුස්ලිම්වරුන්ට අත්වීම.
4. බුද්ධි ප්‍රබෝධය

34) අප්‍රිකා මහද්වීපයේ සුභ පැත්මේ තුඩුව සොයාගත් දේශ ගවේෂකයා වන්නේ,

1. වස්කෝ ද ගාමා
2. බර්තොලමියු ඩයස්
3. ක්‍රිස්ටෝපර් කොලොම්බස්
4. ෆර්ඩිනන්ඩ් මැගලන්

35) කාර්මික විප්ලවය නිසා දේශපාලන ක්ෂේත්‍රයේ ඇතිකළ වෙනස්කමක් දැක්වෙන පිළිතුර වන්නේ,

1. නගර සංඛ්‍යාව විශාල වීම.
2. බද්ධ ව්‍යාපාර සමාගම් බිහිවීම.
3. පන්ති සහිත සමාජයක් බිහිවීම.
4. කම්කරු වැඩවර්ජන ඇරඹීම හා වෘත්තීය සංගම් බිහිවීම.

- පහත A, B, C, D වලින් දැක්වෙන ප්‍රකාශ / පද යුගල අධ්‍යයනය කර 36 සිට 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. ඇමෙරිකානු විප්ලවය
  2. බොස්ටන් තේ සාදය

B - 1. වී. අයි. ලෙනින්
  2. සමාජවාදය

C - 1. ඔටෝවොන් බිස්මාර්ක්
  2. විලියම් කෛසර්

D - 1. ජපානය යටත් වීම.
  2. දෙවන ලෝක මහා සංග්‍රාමය

36) පළමුවැන්න නිසා දෙවැන්න අවසන් වීම පෙන්වන ප්‍රකාශ / පද යුගලය පෙන්වන පද යුගලය තෝරන්න.

1. A
2. B
3. C
4. D

37) දෙවැන්නේ වර්ධනය නිසා පළමුවැන්න ඇති වීම පෙන්වන ප්‍රකාශ / පද යුගලය පෙන්වන පද යුගලය තෝරන්න.

1. A
2. B
3. C
4. D

38) දෙවැන්න නිසා පළමුවැන්නේ ක්‍රියා කලාපය ප්‍රතිඵල රහිත වීම පෙන්වන ප්‍රකාශ / පද යුගලය පෙන්වන පද යුගලය තෝරන්න.

1. A
2. B
3. C
4. D

39) සෝවියට් දේශයේ මග පෙන්වීම මත සමාජවාදී බල කඳවුරට සම්බන්ධ වූ රටවල් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. බටහිර ජර්මනිය, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව
2. හංගේරියාව, නැගෙනහිර ජර්මනිය, පෝලන්තය
3. පෘතුගාලය, නෙදර්ලන්තය, ඉතාලිය
4. ග්‍රීසිය, පෝලන්තය, ප්‍රංශය

40) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයට අයත් නිශේධ බලය හිමි රටවල් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

1. ඉන්දියාව, චීනය, ඇමෙරිකාව, ප්‍රංශය, ඉතාලිය
2. චීනය, ඇමෙරිකාව, රුසියාව, කැනඩාව, ඉන්දියාව
3. චීනය, ප්‍රංශය, ඇමෙරිකාව, රුසියාව, බ්‍රිතාන්‍යය
4. බ්‍රිතාන්‍යය, ජර්මනිය, ප්‍රංශය, රුසියාව, ඉන්දියාව

* * *

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**HISTORY**

**ඉතිහාසය**

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ඉතිහාසය II

## අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 3 යි**

සැළකිය යුතුයි.

- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.

1) පහත (I) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ද, (II) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද නිවැරදිව ලකුණු කොට නම් කරන්න.

**අ)** (I) ඌරාතොට, යාන්ඔය, නාච්චාදූව වැව, මහියංගනය, දීඝවාපිය, බුන්දල, කඳුරුගොඩ, කච්චරගාම, ඇළහැර අමුණ, කොළඹ, යෝධ වැව, සීගිරිය

(II) කළු මුහුද, මක්කම, පිලිපීන දූපත්, නයිල් ගඟ, සුවස් ඇළ, හිරෝෂිමා

(ලකුණු 18)

**ආ)** (I) පහත A, B, C, D යටතේ දක්වා ඇති තොරතුරුවලට සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙලින් නිවැරදිව ලියන්න.

A - කුණාටුවකට හසුව අහඹු ලෙස ශ්‍රී ලංකාවට ගොඩබට පෘතුගීසි ජාතිකයා වන්නේ,


B - බෙලිගල නම් ස්ථානයේ දළදා මාළිගාවක් නිර්මාණය කර දළදා වහන්සේ තැන්පත් කළ රජු වන්නේ,

C - එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය කිරීම සඳහා මුල් වූ රුසියානු නායකයා වන්නේ,

D - 1795 දී ලන්දේසින් සතුව පැවති ත්‍රිකුණාමල වරාය අල්ලා ගැනීමෙන් පසු රාජාධි රාජසිංහ රජු හමු වූ ඉංග්‍රීසි ජාතිකයා වූයේ,

(ලකුණු 04)

(II) A හා B යටතේ දක්වා ඇති රූප සටහන්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A - (i) මෙම ප්‍රතිමාව කුමන රජුගේ ද?

(ii) මෙම ප්‍රතිමාව දැකිය හැක්කේ කුමන ස්ථානයේ ද?

(iii) මෙතුමාගේ කාලයේ තානාපති සම්බන්ධතා පැවැත්වූ රට කුමක් ද?

(iv) එම රටින් මෙරටට රැගෙන එන ලද වටිනා ද්‍රව්‍ය කුමක් ද?

(ලකුණු 04)



B - (i) මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද?

(ii) මොහු විසින් රචනා කරන ලද වැදගත් ග්‍රන්ථය කුමක් ද?

(iii) මොහු විසින් රටේ බලය බෙදිය යුතු යැයි ප්‍රකාශ කළ ප්‍රධාන අංශ තුන නම් කරන්න.

(iv) මොහුගේ රට කුමක් ද? (ලකුණු 04)

2) i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිතා කළ අභිචාර විධි ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. a) පූර්ව ඓතිහාසික යුගය, ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් වී පෙනෙන සාධක තුනක් ද,

b) මුල් ඓතිහාසික යුගයේ බිහි වූ වාපි ගම් දෙකක් ද නම් කරන්න. (ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

3) i. රජවරුන්ගේ ක්‍රියා කලාපය අනුව පහත රාජ්‍යත්ව සංකල්ප ආරෝපණය වූ රජවරු වරහන් තුළින් තෝරා ලියන්න.

A - දේවත්ව

B - පර්වතරාජ

C - චක්‍රවර්තී

( IV වන කාශ්‍යප, නිශ්ශංකමල්ල, කූටකණ්ණ අභය, I වන කාශ්‍යප, බුද්ධදාස) (ලකුණු 03)

ii. පහත සඳහන් එක් එක් කරුණු හා සම්බන්ධ පුද්ගලයන් නම් කරන්න.

A - ප්‍රාදේශීය පාලකයන් කිහිප දෙනෙකු හා සටන් කොට අනුරාධපුර රාජධානිය ගොඩනගා රජ බවට පත් වීම.

B - ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවයට කතරගම හා චන්දනගම ක්ෂත්‍රියන්ට ආරාධනා කළ රජු

C - රට ආස්ථානවලට බෙදා ඒවා පාලනයට වෙනම ඇමතිවරු පත් කළ රජු

D - පරුමකවරුන් ලෙස කටයුතු කළ අයට මධ්‍ය පාලනයේ සේනාපති තනතුරු පිරිනැමීම. (ලකුණු 04)

iii. පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම සඳහා පැරණි පාලකයන් කටයුතු කළ ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. I වන විජයබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු දෙකකින් විස්තර කරන්න. (ලකුණු 06)

4) i. ජලය රැගෙන යාම සඳහා පැරැන්නන් විසින් ඉදිකළ ප්‍රධාන ඇළ මාර්ග තුනක් නම් කරන්න.

(ලකුණු 03)

ii. ජල කළමණාකරණයේ උසස්ම නිර්මාණය වන්නේ වැව යි. පහත A, B, C, D වලින් දක්වා ඇත්තේ වැවක ප්‍රධාන කොටස් කිහිපයකි. ඒවායින් කෙරෙන කාර්යයන් මොනවාදැයි ලියන්න.

A - සොරොව්ව B - රළපනාව

C - වැව් බැම්ම D - පිටවාන (ලකුණු 04)

iii. අතීත ලංකාවේ අපේ මුතුන් මිත්තන් සතුව පැවති මැනීම හා ගණනය පිළිබඳ දේශීය දැනුම කරුණු දෙකකින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. විද්‍යාව හා තාක්ෂණය භාවිතා කොට පැරැන්නන් උසස් වාස්තු විද්‍යාත්මක නිර්මාණ සිදු කර ඇති බව උදාහරණ තුනක් යොදාගෙන පෙන්වා දෙන්න. (ලකුණු 06)

5) i. පහත සඳහන් රජවරු පාලනයට පත් වූ රාජධානිය වරහන් තුළින් තෝරා A,B,C අනුපිළිවෙළින් ලියන්න.

A - II පරාක්‍රමබාහු රජු

B - IV පරාක්‍රමබාහු රජු

C - VI පරාක්‍රමබාහු රජු

( කුරුණෑගල, දඹදෙණිය, කෝට්ටෙ) (ලකුණු 03)

ii. දෙවන නාගරීකරණයට අයත් රාජධානි හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. 13 - 15 සියවස් අතර කාලයේ මෙරට රාජධානි ගොඩනැගීමේ දී කැපී පෙනුණු ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. කෝට්ටේ රාජධානියේ පරිහානියට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

6) i. පහත නම් සඳහන් පුද්ගලයන් රාජ්‍යත්වයට පත් වූයේ කුමන නමකින්දැයි වරහන් තුළින් තෝරා ලියන්න.

A - කන්නසාමි

B - මහා අස්ථාන

C - කොනප්පු බණ්ඩාර

( II වන රාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ, I වන විමලධර්මසූරිය) (ලකුණු 03)

ii. පෘතුගීසීන් උඩරට ආක්‍රමණය කළ පහත සටන් සඳහා නායකත්වය ගත් මෙරට රජවරු දෙදෙනා ලියන්න.

A - ගන්නෝරු සටන

B - බලන සටන (ලකුණු 04)

iii. මහනුවර රාජධානියේ පැවති ආර්ථික ලක්ෂණ දෙකක් නිදසුන් සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. මහනුවර රාජධානිය පෘතුගීසි හා ලන්දේසීන්ට යටත් කර ගැනීමට නොහැකි වූ හේතු තුනක් කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 06)

7) i. ප්‍රංශ ජාතීන් ඉන්දියාවේ පිහිට වූ වෙළඳ මධ්‍යස්ථාන පමණක් වරහන් තුළින් තෝරා ලියන්න.

( සුරාත්, කරිකාල්, පොන්ඩිචෙරි, බොම්බාය, චන්දනගර්, කල්කටා ) (ලකුණු 03)

ii. ක්‍රි.ව. 1815 දෙවන උඩරට ආක්‍රමණය සාර්ථක වීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii. වතු වගාවේ දියුණුව සඳහා බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. නිදහසින් පසු මෙරට ආර්ථිකයේ කැපී පෙනුන ලක්ෂණ තුනක් නිදසුන් සහිතව පැහැදිළි කරන්න.

(ලකුණු 06)

## III කොටස

8) i. යුරෝපයේ කාර්මික විප්ලවය තුළ පහත නිර්මාණ කළ පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.

A - දුවන නඩාව

B - දුම් බෝට්ටුව

C - වාෂ්ප දුම්රිය

( රොබට් පුල්ටන්, ජෝර්ජ් ස්ටීවන්සන්, ජෝන් කේ. ) (ලකුණු 03)

ii. කාර්මික විප්ලවය අන් රටවල පැතිරීමට තිබූ බාධා දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. කාර්මික විප්ලවයේ බලපෑම මෙරට ආර්ථිකය තුළ ඇතිකළ වෙනස්කම් කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

iv. කාර්මික විප්ලවයේ අහිතකර බලපෑම් ලෝකය තුළ ගැටළු රැසක් නිර්මාණය කර ඇත. මෙය කරුණු තුනක් යටතේ විස්තර කරන්න. (ලකුණු 06)

9) i. පළමු ලෝක යුද්ධයේ දී මිත්‍ර පිළ නියෝජනය කළ ප්‍රධාන රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. පළමු ලෝක යුද්ධයෙන් පසු ලෝක සාමය උදෙසා බිහි වූ ජාතීන් සංගමයේ අරමුණු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii. දෙවන ලෝක යුද්ධයේ දී ජර්මනියේ හා ජපානයේ ක්‍රියා කලාපය නිදසුන් සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල තුනක් කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 06)

MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

HISTORY

ඉතිහාසය

# MARKING SCHEME - I,II

# පිළිතුරු පත්‍රය - I,II



අනුග්‍රහය :

# අ.පො.ස. (සාමාන්‍ය පෙළ) - පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය

## 11 වසර - ඉතිහාසය

## පිළිතුරු පත්‍රය

**I පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1) | 3 | 11) | 4 | 21) | 3 | 31) | 3 |
| 2) | 4 | 12) | 4 | 22) | 3 | 32) | 1 |
| 3) | 1 | 13) | 3 | 23) | 4 | 33) | 3 |
| 4) | 2 | 14) | 2 | 24) | 2 | 34) | 2 |
| 5) | 3 | 15) | 3 | 25) | 3 | 35) | 4 |
| 6) | 4 | 16) | 1 | 26) | 4 | 36) | 4 |
| 7) | 2 | 17) | 1 | 27) | 1 | 37) | 1 |
| 8) | 1 | 18) | 2 | 28) | 2 | 38) | 3 |
| 9) | 1 | 19) | 1 | 29) | 4 | 39) | 2 |
| 10) | 2 | 20) | 2 | 30) | 2 | 40) | 3 |

## II පත්‍රය

1) අ) I, II සිතියම් වලින් දක්වනු ලැබේ.

ආ) (I) A - ලොරෙන්සෝ ද අල්මේදා

B - III විජයබාහු රජු

C - ජෝෂප් ස්ටාලින්

D - රොබට් ඇන්ඩෲස්

(II) A රූපය - (i) භාතිකාභය රජුගේ

(ii) රුවන්වැලි මහ සෑ මළුවේ

(iii) රෝමය

(iv) වීදුරු පබළු

B රූපය - (i) මොන්ටෙස්කියු

(ii) නීතියේ සාරය

(iii) ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ

(iv) ප්‍රංශය

2) i. පාහියන්ගල, බටදොඹ ලෙන, කිතුල්ගල බෙලිලෙන

ii. නමා වකුටු කොට වැළලීම.

ගල් ගුහාව තුළම වලක් හාරා වැළලීම.

ඇටසැකිලි මත ගුරුගල් ආලේප කිරීම.

iii. a) ස්ථිරවාසීතාව.

ගොවිතැන ඇරඹීම.

මැටි භාණ්ඩ නිපදවීම.

ලෝහ භාවිතය

ක්‍රමවත් සුසාන භූමි චාරිත්‍ර විධි අනුගමනය

b) සුමනවාපිගාම

විහාරවාපීගාම

හුන්දරීවාපිගාම

කඩහවාපිගාම

iv. <u>ව්‍යුහය</u>

- වාපි ගම් - උදා: සුමනවාපිගාම, විහාරවාපීගාම, හුන්දරීවාපිගාම, කඩහවාපිගාම
- වෘත්තිය අනුව ගම් බිහි වීම - උදා: ගෝපාල ගම්, කසීකාරගම්, කේවට්ටගාම
- කාර්ය පදනම්ව බිහි වූ ගම් - උදා: පටුන්ගම්,නියම්ගම්, ඔලගම්

<u>ස්වරූපය</u>

- කුඩා ගමක් හෙක්. 0.15 ක් පමණ වීම. මධ්‍යම ගමක් හෙක්. 2ක් පමණ විශාල වීම. නාගරික ජනාවාස හෙක්. 2ට වැඩි වීම.
- ගමක පවුල් 5ක් 6ක් පමණ වාසය කිරීම. විශාල ගම්වල පවුල් 30ක් පමණ වාසය කිරීම.
- නාගරික ජනාවාසයක 35,000ක පමණ ජනගහනයක් වාසය කිරීම.
- වැටකින් ආරක්ෂා වූ ගම් පරිකිත්ත ගම් ලෙස හා එසේ නොවූ ගම් අපරිකිත්ත ගම් ලෙස හැඳින්වීම.

3) i. A - කූටකණ්ණ අභය

B - I වන කාශ්‍යප

C - නිශ්ශංකමල්ල

ii. A - පණ්ඩුකාභය රජු B - දේවානම්පියතිස්ස රජු

C - වසභ රජු D - දුටුගැමුණු රජු

iii. බුද්ධදාස රජු රෝහල් ඉදිකිරීම.

V වන මිහිඳු රජු දිවයිනේ රෝහල්වලට පහසුකම් සැපයීම.

IV වන කාශ්‍යප රජතුමා උණ රෝහලක් සෑදීම.

I වන උපතිස්ස රජු මාතෘ නිවාස සෑදීම.

දුටුගැමුණු රජු රෝහල් 18ක් ඉදිකිරීම.

iv. ලංකාව චෝල පාලනයෙන් මුදාගෙන එක්සේසත් කිරීම.

සිය පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරා ගැනීම.

අනාගත චෝල ආක්‍රමණයන් වැළැක්වීමට තම විදේශ ප්‍රතිපත්ති මෙහෙයවීම.(කාලිංග, පාණ්ඩ්‍ය, බටහිර චාලුක්‍යයන් සමඟ මිත්‍ර සබඳතා)

4) i. ඇළහැර ඇළ

මිණිපේ ඇළ

යෝධ ඇළ

පබ්බතන්ත ඇළ

ගෝමතී ඇළ

ii. A - සොරොව්ව - වැවේ ජලය අවශ්‍ය අවස්ථාවල දී වැවෙන් පිටතට ලබා දීම.

B - රළපනාව - ජලය පිරුණු පසු වැව් බැම්මේ ඇතුල් පැත්තට ජලයෙන් ඇතිවන පීඩනය අවම කිරීම සඳහා යොදා ගන්නා ගල් ඇතුරුම

C - වැව් බැම්ම - ජලය රඳවා ගැනීම සඳහා ශක්තිමත්ව ඉදිකරන පස් බැම්ම

D - පිටවාන - වැව ජලයෙන් පිරීමේ දී වැව් බැම්මට වන පීඩනය අවම කිරීම සඳහා වැඩි ජලය පිටතට ගෙනයාම

iii. <u>අවකාශය මැනීම</u>

කෘෂිකර්මාන්තයේ දී විශේෂයෙන් කුඹුරු වගාවේ දී මෙම අවකාශය මැනීම භාවිතා කල බව

උදා : කිරිය, අමුණ, පැල, කරීසය,ලාහ ආදී නම් භාවිතා කොට වගා කරන ප්‍රමාණය ආසන්න වශයෙන් මැන තිබීම.

| | | |
|---|---|---|
| ලාහ 40 | - | පැල 1 |
| පැල 12 | - | කුරුණි 12 |
| කුරුණි 44 | - | අමුණු 1 |
| අමුණු 1 | - | කරීස 0.25 |

<u>බර මැනීම</u>

- වෙළඳ කටයුතු සඳහා බර මැනීම භාවිතා කළ බව
- රජු විසින් අනුමත කිරුම් මිනුම් උපකරණ භාවිතා කල යුතු බවට නීති පනවා තිබීම.

(සොරබොරවැව ටැම් ලිපියේ සඳහන් තොරතුරු)

| | | |
|---|---|---|
| වීහ 4 | - | ගුන්ජා 1 |
| ගුන්ජා 2 | - | මාසක 1 |
| මාසක 2.5 | - | අක 1 |
| අක 8 | - | ධරණ 1 |
| ධරණ 5 | - | ස්වර්ණ 1 |
| ස්වර්ණ 2 | - | පල 1 |

<u>කාලය මැනීම</u>

- කෘෂිකර්මයේ බෝග වගාව, වැපිරීම, අස්වැන්න නෙළීම ආදී කටයුතු කාලයට අනුව සකස් කරගැනීම සඳහා කාලය මැනීම අත්‍යාවශ්‍ය වීම.
- සඳ ගමන අනුව කාලය ගණනය කිරීම. දිගු කාලයක් සඳහා වර්ෂය යන පදය භාවිතා කිරීම.
- පසලොස්වක සිට අමාවක දක්වාත්, අමාවක සිට නැවත පසලොස්වක දක්වාත් කාලය මාසයක් බව පිළිගැනීම, එය දුරුතු, නවම්, මැදින්, බක් ආදී ලෙස නම් කර තිබීම.

iv. අනුරාධපුර රුවන්වැලි මහා සෑ අත්තිවාරම සකස් කර ඇති ආකාරය දැක්වීම.

ලෝවාමහාපාය ඉදි කිරීම.

නගර සැලසුම් ( අනුරාධපුරය, පොළොන්නරුව)

සීගිරි මාළිගාව

විශාල චෛත්‍ය නිර්මාණය කර තිබීම.

රජ මාළිගා හා අනෙකුත් ගොඩනැගිලි ඉදිකර තිබීම.

(උදාහරණ සහිතව දැක්විය යුතු යි.)

5) i. A - දඹදෙණිය

B - කුරුණෑගල

C - කෝට්ටේ

ii. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ

iii. ආරක්ෂාව සම්බන්ධව වැඩි අවධානයක් යොමු කිරීම.

රට අභ්‍යන්තරයේ රාජධානි පිහිටුවීමට උනන්දු වීම.

iv. VII බුවනෙකබාහු රජු පෘතුගීසි සහය පැතීම.

ධර්මපාල කුමරු කතෝලික දහම වැළඳ ගැනීම.

ධර්මපාල කුමරු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජධානිය පෘතුගීසීන්ට පැවරීම.

6 ) i. A - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

B - II වන රාජසිංහ රජු

C - I විමලධර්මසූරිය රජු

ii. A - II වන රාජසිංහ රජු

B - I විමලධර්මසූරිය රජු

iii. ස්වයංපෝෂිත ආර්ථිකයක් පැවතීම.

හේන් වගාව ජනප්‍රිය වීම.

විවිධ කර්මාන්ත පැවතීම. (යකඩ, දැව, ලෝහ, ලාක්ෂා, පන්....)

iv. උඩරට පිහිටීම. (ගිරි දුර්ග, වන දුර්ග, ජල දුර්ග පැවතීම)

දේශීයන්ගේ ගරිල්ලා සටන් ක්‍රම.

උඩරට සමගියක් පැවතීම.

7) i. A - කරිකාල් B - පොන්ඩිචෙරි C - චන්දනගර්

ii. උඩරට අසමගිය

රදළවරු ඉංග්‍රීසින් වෙත යාම.

iii. රජය සතු වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම.

විදේශ ආයෝජකයන්ට මෙරටට පැමිණීමට තිබූ නීති රීති ලිහිල් කිරීම.

iv. මහවැලි බහුකාර්ය යෝජනා ක්‍රමය ඇරඹීම.

නව ගොවි ජනපද ව්‍යාපාරය ඇරඹීම.

කර්මාන්ත ඇරඹීම.

8) i. A - ජෝන් කේ. B - රොබට් පුල්ටන් C - ජෝර්ජ් ස්ටීවන්සන්

ii. ප්‍රංශය වැනි රටවල් හස්ත කර්මාන්ත භාණ්ඩවලට වැඩි කැමැත්තක් දැක්වීම.

ප්‍රංශය වැනි රටවල අභ්‍යන්තර තීරු බදු පැවතීම.

ඕලන්දය වැනි රටවල ස්වභාවික සම්පත් හිඟ වීම.

එංගලන්තය තම කාර්මික නිෂ්පාදන බාහිරට විවර නොකිරීම.

iii. යටිතල පහසුකම් දියුණුව, වාණිජ බෝග වගාව, මූල්‍යමය වාතාවරණයක් ඇතිවීම.

iv. පරිසර දූෂණය, ඕසෝන් ස්ථරයට හානි සිදුවීම, නව අධිරාජ්‍යවාදය

9) i. බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය

ii. රටවල් අතර ඇතිවන ආරාවුල් සාකච්ඡා මගින් විසඳීම.

නැවත ලෝක යුද්ධයක් ඇතිවීම වැළැක්වීම.

කුඩා රාජ්‍යයන්ගේ නිදහස ආරක්ෂා කිරීම.

iii. ජපානය - ජපානය ලැබූ ඉහළ කාර්මීකරණයත් සමග අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අරමුණින් යටත් විජිත පිහිටුවීමට කටයුතු කිරීම.

ජපානය බ්‍රිතාන්‍යයන් සතු යටත් විජිත අල්ලා ගැනීම.

ජර්මනිය - හිට්ලර්ගේ නැගීම.

හිට්ලර්ගේ ක්‍රියා කලාපය

iv. එක්සත් ජාතීන්ගේ සංගමය බිහි වීම.

යටත් විජිතවලට නිදහස ලැබීම,

මිත්‍ර පිළ ජය ගැනීම.